**කවරයේ කතාව**

# අඩු වැඩි තැන් හැඩ වැඩ කරන ප්ලාස්ටික් සැත්කම්

සේකෝ කිමුරා යනු වයස 18 ක් වූ නිදිබර දෑසක් සහිත ලජ්ජාශීලී විශ්ව විද්‍යාල සිසුවියකි. එහෙත් ඇගේ මෙම ස්වරූපය ඇගේ ඒක් රහසිගත සොයා ගැනීමක් සමගම වෙනස් විය. එනම් තම ඇස්වලට ඉහළින් මැලියම් පටියක් දැමූ විට ඒවා වඩා විශාල රවුම් හා ආකර්ෂණීය බවක් උසුලන බව ඇයට පෙනිණි. ඇගේ මෙම නවපෙනුම ඇය වඩා ආකර්ෂණීය කෙනෙක් බවට පත් කළ අතර අවන්හලක සේවිකාවක් වශයෙන් කළ රැකියාවේ ද යහපත් ලෙස ද රැඳී සිටීමේ හැකියාව ඉන් තහවුරු විය.

එහෙත් කිමුරා ජීවත් වූයේ මෙය හෙළි-දරව් වේය යන නිරන්තර බියෙනි. මේ නිසා ඇය මැලියම් ආලේප කිරීමට කිහිප වතාවක් නාන කාමරයට යමින් ද මුහුදු වෙරළට යාමෙන් වැලකී සිටිමින් ද කාලය ගත කළා ය. වයස අවුරුදු 21 දී ඇය නතර වූයේ ටෝකියෝ සිටි වෛද්‍යවරයෙක් ළඟ ය. ශල්‍ය වෛද්‍ය කටුසියා ටකාසු ඉතා උනන්දුවෙන් ඔහුගේ සියුම් උපකරණ සමග අරගල කරමින් "ඔබට ටිකක් රිදෙයි" යනුවෙන් පවසන අයුරු කිමුරාට ඇසිණි. නිර්වින්දන ලබා දීමෙන් පසු වෛද්‍යවරයා කොක්කක් සහිත ඉඳිකටුවක් ගෙන උඩු ඇසිපිය මත නොමැකෙන නැම්මක් ඇති කළේ ය. ඉන්පසු ඔහු හ්‍යුලුරොනික් ඇසිඩ් ඇගේ නාසයට හා නිකටට ඇතුල් කර ඒවා හැඩ කරන ලදී. තම කාර්යය පිළිබඳ සෑහීමකට පත වූ ටකාසු එය පරීක්ෂා කර ඉදිමුම ටික දිනකින් ඇරිලා යනවා" යයි පැවසී ය. එහෙත් අද දින වුණත් ඔබ ඉතා ආකාර්ෂණීය ලෙස දිස්වනවාට කිසිදු සැකයක් නැතැයි යන්න ඔහුගේ අදහස විය. හෙදියක් කිමුරාට කැඩපතක් පෑවා ය. රත්පැහැ හා ඉදිමුණ නමුත් ඇය සැමවිට ම සිහින මැවූ ඒ මුහුණ ඇය ඉදිරියේ විය. විශාල රවුම් ඇස් දිගු නාසයක් හා වෙන්ව පෙනෙන නිකටත් දැන් ඇය සතු ය. මෙම සම්පූර්ණ ක්‍රියාවලියට ම ගත වූයේ මිනිත්තු 10කටත් වඩා අඩු-කාලයකි. මුහුණ මත අයිස් බෑගයක් තබා ගත් කිමුරා වේදනාවෙන් කෙඳිරිගානු දක්නට ලැබිණි.

ලස්සන වීම සඳහා අප නොකරන්නේ කුමක් ද? ආසියාවේ ගැහැනුන් මෙන ම පිරිමි ද වඩා හොඳ පෙනුමක් ලබා ගැනී ම සඳහා විවිධ දේ කරති. සංස්කෘතික බාධක අඩු පාරිභෝජනය සම්බන්ධ බටහිර ට වඩා ආසියාව පසුගාමී බවක් පෙන්නුම් කළ ද වර්තමානයේ පෙර නොවූ විරූ ලෙස ප්ලාස්ටික් සැත්කම් ආසියාවේ ජනප්‍රිය වෙමින් පවතියි. තායිවානයේ මෙවන් සැත්කම් මිලිය-නයක් පමණ පසුගිය වසරේ සිදු කර ඇත. එය වසර පහකට පෙර තිබූ ප්‍රමාණයට වඩා දෙගු-ණයක වර්ධනයකි. කොරියාවේ ශල්‍ය වෛද්‍ය-වරු අනුමාන කරනුයේ වැඩිහිටි පුද්ගලයන් 10 කට එක් අයෙක් කුමන හෝ ආකාරයක ශල්‍ය කර්මයකින් තම පෙනුමට නව ආකර්ෂණයක් ලබා ගෙන ඇති බව යි. කුඩා දරුවන්ගේ පවා ඇසිපිය සකස් කිරීමකට ලක්ව ඇත. තායිලන්ත රජය ජංගම ප්ලාස්ටික් සැත්කම් ක්‍රමයක් පවා පවත්වා ගෙන යයි. එසේ ම මේවායින් ලැබෙන ආදායම ද ඉතා ඉහළ ය.

එසේ ම ආසියාව පුරා සිදුවන මෙම ක්‍රියාවලිය ලේඛනගත කිරීම අපහසු තත්ත්වයක පවතියි. එයට හේතුව නිත්‍යානුකූල මෙන් ම නිත්‍යනුකූල නොවන මට්ටම්වලින් ද මෙම ක්‍රියාවලිය සිදුවන නිසා ය. උදහරණයක් වශයෙන් ඉන්දුනීසියාව ගත් විට මිලියන 230 පමණ වූ ඉන්දුනීසියානු



**ටෝකියෝ, කිමුරා. ඇගේ දෑස්, නිකට හා නාසය සකස් කරන අවස්ථාවේදී**



ජනගහනයට සිටිනුයේ නිත්‍යනුකූල ප්ලාස්ටික් ශල්‍ය වෛද්‍යවරු 43 ක් පමණි. නමුත් අගනුවර පමණක් නිත්‍යනුකූල නොවන ශල්‍යකර්ම 400 පමණ සතියකට සිදු වේ.

චීනයේ ෂෙන්ඩෙහෙන් නුවර නිත්‍යනුකූල නොවන දහස් ගණන් "රූපලාවණ්‍ය විද්‍යා ආයතන" මගින් රුව වැඩි කර ගැනීම කෙරෙහි උනන්දුව ඇති මිනිසුන්ට ඔවුන්ගේ නව වාහන හා ඇඳුම්වලට ගැලපෙන්නට දෑසක් හෝ නාසයක් මිලදී ගැනීම කෙරෙහි පෙළඹ වීම බහුලව සිදු වේ.

මේවායේ ප්‍රතිඵල නිරන්තරයෙන් ම ව්‍යසනකාරී ය. චීනයේ පමණක් මෙම ශල්‍යකර්ම කරුවනට එරෙහිව නඩු 200,000 කටත් වඩා පසුගිය දශකය තුළ ඇති බව චයිනා කොලිටි ඩේලි පුවත්පත පවසයි. මෙහි භයානකකම වැඩි ලෙස ම පවතින්නේ සෙන්ෂෙන් හි දී ය. වෛද්‍ය පිලිප් හෂි පවසන අන්දමට ඕනෑම පුද්ගලයකුට ව්‍යාජ හෝ අව්‍යාජ ලියවිල්ලක් සහිතව එහිදී මෙම කටයුතු සිදු කළ හැකි ය. ඉක්මන් ප්‍රතිඵල සඳහා ඔවුහු අනුමත නොකළ දේ භාවිත කරති. චීන ජනතාවට ඔවුන් සිටින අවදානම් තත්ත්වය පිළිබඳ නිවැරදි වැටහීමක් නොමැති ය.

සත්‍ය වශයෙන් ම ආසියාතිකයන් ලස්සන වීම සඳහා නිරන්තරයෙන් සිරුරට වද වේදනා දී ඇත. චීනයේ තිබූ පැරණි සිරිතක් වූ කාන්තවන්ගේ පතුල් වෙළීම, කැරන කාන්තවන්ගේ ගෙල දිගු කිරීම සඳහා පිත්තල දඟර භාවිත කිරීම මේ අතර වේ. ඒ අතර ම ප්ලාස්ටික් සැත්කම් වලින් ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ වූයේ හයවන සියවසේ ඉන්දියාවේ දී යයි කිව හැකි ය. හින්දු වෛද්‍ය වාර්තාවක් වූ susruta Samhitaවල අනාචාරයේ හැසිරීමට දුන් දඬුවමක් ලෙස නාසය පොඩි කිරීමෙන් පසුව ඒවා නැවත සකස් කළ ආකාරය කිය වේ.

වර්තමානයේ ඇති වී තිබෙන ප්‍රවණතාව නම් බොහෝ ආසියාතිකයන් කොකේසියානු පෙනුම කෙරෙහි ආකර්ෂණය වීම යි. බහුතරය මෙය ප්‍රතික්ෂේප කරන අතර සුළුතරයක් තර්ක කරනුයේ හොලිවුඩ් සිනමාව චන්ද්‍රිකා රූපවාහිනිය ආදි දේවල දැඩි බලපෑම ආසියාකරයේ සෞන්දර්යාත්මක පරමාදර්ශයන් ඉතා වේගයෙන් වෙනස් කර ඇති බව යි. "ලස්සන යනු පරිණාමය වන දෙයකි" යනුවෙන් "වඩා ලස්සන පුද්ගලයා පවතිනු ඇත" රූපයේ විද්‍යාව නමැති කෘතිය ලියූ මනෝ වෛද්‍ය මහාචාර්ය නැන්සි එට්කොෆ් පවසයි. ආසියාතියකයින්ගේ ඉල්ලුම පුළුල් ඇස් දිගු නාසය හා වඩා පිරුණු ළැමක් ආදි එම වර්ගයට ආවේණික නොවූ ලක්ෂණ කෙරෙහි වේගයෙන් යොමුවෙමින් පවතියි. මෙම ඉල්ලීම්වලට සරිලන සේ ශල්‍ය වෛද්‍යවරුනට ඔවුන්ට ම අනන්‍ය වූ උපකරණ නිපදවා ගැනීමට සිදු වී ඇත. ඉන් එක ක්‍රමයක් වන්නේ සියුම් මුවහත් උපකරණයකි. ඇස්පිය මත රේඛාවක් සටහන් කිරීම යයි එක්සත් රාජධානියේ ද මෙය ජනප්‍රිය නමුත් ඇස්වටින් මේදය ආදිය ඉවත් කිරීමට ද ඒ අතර වෙයි එසේ ම බටහිර ජාතිකයන් බෝටොක්ස් හෝ බොටුලිනම් ඇසිඩ් මුහුණේ රැළි ඉවත් කිරීමට යොදා ගනී. එසේ ම කොරියාවේ ජපානයේ හා තායිවානයේ කම්මුල්වල මහත අඩු කිරීම සඳහා බොටොක්ස් එන්නත් කරනු ලැබේ.

ආසියාතික මුහුණු වලට අනන්‍ය වූ ව්‍යායමයන් අවශ්‍ය වන්නා සේ ම ඔවුන්ගේ සිරුරු ද ජනප්‍රිය බටහිර ශරීර ලක්ෂණවලට සම කිරීම සඳහා නව ශල්‍ය කර්ම කිරීම අවශ්‍ය වෙයි. එයට හේතු වන්නේ බටහිර ජනතාවගේ ශරීරය හැඩ ගැසී ඇති ආකාරයට වඩා ආසියාතික මිනිසාගේ සිරුර හා මස්පිඬු හැඩ ගැසී ඇති ආකාරයත් වෙනස් වීම නිසා ඒවාට අනන්‍ය වූ ක්‍රම සොයා ගැනීමට සිදු වීම යි.

ආසියාවේ ප්ලාස්ටික් සැත්කම් ව්‍යාපරය ලිංගිකත්වය දක්වා ව්‍යාප්ත වී තිබේ. චීනය කොරියාව ඉන්දුනීසියාව වැනි කන්‍යාභාවය ඉතා අගය කොට සලකන රටවල තරුණියෝ ඔවුන්ගේ මංගල දිනට පෙර කන්‍යාභාවය නැවත ඇති කර ගැනීම සඳහා පැමිණෙති. එසේ ම ජපානය ඉන්දුනීසියාව හා කොරියාව වැනි රටවල පුරුෂ ලිංගය විශාල කිරීම සඳහා ද වැඩි ඉල්ලුමක් පවතියි. තායිලන්තයේ ජනප්‍රිය වූ ලේඩි බෝයිස් ලෙස හැඳින්වෙන පිරිස් නම ලිංගිකත්වය පිරිමි බවේ සිට ගැහැනු බව දක්වා වෙනස් කර ගැනීම කෙරෙහි උනන්දු වී සිටිති.

වසර 57 ක් වයස ටකාසු මහතා ප්ලාස්ටික් සැත්කම් මගින් වසර 10 පමණ තරුණ වූ ඔහුගේ මුහුණ ඔහුගේ නව ව්‍යාපාරය සඳහා දැන්වීමක් ලෙසට භාවිතා කරයි. වර්තමාන ලෝකයේ සියලු ම අලංකාරයන් සඳහා මිලක් පවතියි. මිනිසුන්ට වඩා ලස්සන වීම අවශ්‍ය වන්නේ සමහර විට තමන්ගේ ධනවත් බව ලෝකයට ප්‍රකාශ කිරීම සඳහා විය හැකි ය. තායිපේ හි ශල්‍ය වෛද්‍යවරයකු වන ජින් ලින් පවසන්නේ මිල වැඩිවන විට ඔහුගේ පාරිභෝගික සංඛ්‍යාව වැඩිවන බව යි. එසේ ම තරගකාරී රැකියා වෙළඳපල ද මෙයට හොඳ හේතුවක් සපයයි. ඩිනයේ රූපලාවන්‍ය ආයතන හිමියන් පවසනුයේ "චීනයේ ඇති විශාල සංඛ්‍යාවක් මිනිසුන් ජීවත් වෙයි. බිලියන 1.3 කින් ඔබ කැපී පෙනෙනුයේ කෙසේ ද? ඔබේ ලොක්කා එක සමාන දක්ෂතා ඇති දෙදෙනකු දුටුවහොත්

## නිසි වේලාවට සූදානම්ව



හරුහිකෝ වටනාබේ 36, ජපන් ජාතික ශල්‍යකර්මයකින් වෙනස් කරන ලද ඇස්, නිකට හා නාසය ඇතිව

## සුරූපී තරුණිය



යුමි සකගුඩ් 26, ජපන් ජාතික ඇගේ පෙනුම නිසා අකාරුණික ලෙස පීඩාවට පත් වූවාය. ඩොලර් 30 000 මිල වූ ශල්‍යකර්මයකින් පසුව ආකර්ශනීය පෙනුමක් ලබා සිටියි.



**සලේගා, නුපුහුණු ශල්‍යවෛද්‍යවරයෙක් විශ්වාස කළ අතර ඇගේ කළවා වලට සිදුවූ හානිය නිසා නඩු පැවරූ සුවන්ප්‍රදීප් නම් වූ නිළිය**

වඩා හොඳ පෙනුමක් ඇති පුද්ගලයා තිවැරදිව තෝරා ගනු ඇති" ආර්ථික අවපාතවලට හසුවූ තායිලන්ත රජය පවා ප්ලාස්ටික් ශල්‍ය කර්මවල මුදල් ඉපයිය හැකි විභවය අවබෝධ කර ගෙන සිටියි. එහි සංචාරක අධිකාරිය විදේශික සංචාරකයින්ට ප්ලාස්ටික් සැත්කම් කිරීම සඳහා යම් ආයතන වලට සහාය පළ කරයි.

බැංකොක් හි තදබද වූ වීදියක් ආශ්‍රිතව තට්ටු 12 වූ ඩොලර් මිලියන 90 ක් වූ රෝහල තරු පහේ ප්ලාස්ටික් සැත්කම් කම්හලක් වැනි ය. මෙහි විදේශිකයන්ට අධිවේගී internet පහසුකම් මෙන් ම හලාල් කරන ලද ආහාර ලබා ගැනීමට හැකියාව ද සහිත සුවිශේෂී පහසුකම් රාශියක්ස ලසා දී ඇත. ..


70 දශකය මැද භාගයේ තායිලන්තයේ සිටියේ ප්ලාස්ටික් ශල්‍ය වෛද්‍යවරු 10 ක් පමණි. එම යුගයේ තායිලන්ත වැසියෝ තම අවශ්‍යතා සඳහා ජපානයට හා සිංගප්පූරුවට ගියහ. නමුත් අද තායිලන්තය ඒ සම්බන්ධව කිසිදු රටකට තරග නොකළ හැකි මට්ටමකට පැමිණ සිටියි. එසේ ම ඒ සඳහා අය කරනු ලබන මිලෙහි ද විශාල වෙනසක් පවතියි උදා:- ලිංගික පරිවර්තනයක් කිරීම සඳහා ගිය වසරේ ශල්‍ය කිරීම 300 ක් පමණ සිදු කළ වෛද්‍ය ප්‍රීඩා ගේ ගාස්තුව වූයේ ඩොලර් 6000 කි. මෙය බටහිර දී අයකරනු ලබන ඩොලර් 25000 ට සාපේක්ෂව ඉතා පහළ මට්ටමක පවතියි. එසේ ම සිරුර සිහින් කර ගැනීමට අවශ්‍ය වූ කාන්තාවෝ ද ප්ලාස්ටික් ශල්‍ය කර්ම කෙරෙහි යොමු වීම දක්නට ලැබේ.මේ සඳහා යොමු වූ හිරෝෂිමාවෙන් පැමිණි කාන්තාවක් පැවසුවේ ඇය දරුවන් ලැබුණ පසු සිය සිරුර සිහින් කර ගැනීමට විවිධ ක්‍රම භාවිත කළ නමුත් ඉන් ප්‍රතිඵලයක් නොලද නිසා ප්ලාස්ටික් ශල්‍යකර්ම වෙත යොමු වූ බව යි.

තායිලන්තයේ ජනප්‍රිය ටෙලි නාට්‍ය නිළියක වන කවිත්යා සුවන්ප්‍රදීප් ඇගේ විශාල වූ දෙකලවා නිසා ඇයට අභිමිව යා හැකි රඟපෑමේ අවස්ථා පිළිබඳව බිය නිසා ප්ලාස්ටික් සැත්කමක අවදානම් තත්ත්වය ගැන නොසිතූ වා ය. එහෙත් එහි දී ඇයට මුහුණ දීමට සිදු වූ තත්ත්වය මෙසේ ය. ශල්‍යකර්මය සිදු කළ දින ම ඇයට ආපසු යා හැකි බව ඔවුන් පවසා ඇත. එහෙත් ඇවිදීමට අපහසු වූ නිසා ඇයට දින 3ක් නැවතීමට සිදු වී ඇත.

එසේ ම වෙලුම් පටි ඉවත් කළ පසු ඇයට පැල්ලම් හා ලප විශාල ප්‍රමාණයක් තම කලවා හි දක්නට ලැබිණි. වෛද්‍යවරයා පැවසුවේ ඒවා කිහිප දිනකින් මැකී යනු ඇත කියා ය.

# සැත්කමට වහවැටුණු කොරියානු දරුවෝ

දකුණු කොරියානු දරුවන්ට මීට පරම්පරා කිහිපයකට පෙර ඔවුන්ගේ බාහිර පෙනුම පිළිබඳ කිසිදු ආකාරයක පාලනයක් නොවී ය. උදාහරණයක් ලෙස ඔවුන්ගේ කොණ්ඩය ඔවුන්ගේ දෙමව්පියන්ගෙන් ලද ත්‍යාගයක් විය. එහෙත් අද පාසල ඇරී ප්ලාස්ටික් ශල්‍ය වෛද්‍යවරු හමුවට යන දරුවන් නිවසට ගිය විට ඔවුන්ගේ දෙමව්පියන්ට පවා ඔවුන් හරිහැටි හඳුනා ගැනීමට අපහසු වේ.



ආසියාවේ අනෙකුත් ප්‍රදේශවල මෙන් ම කොරියාවේ ද ප්‍රධාන අවධානය යොමු වී ඇත්තේ ඇස් සම්බන්ධව ය. වඩා විශාල දැසක් හිමි කර ගැනීම සෑම ගැහැනු ළමයකුගේ ම අරමුණ වී ඇත. එසේ ම එය ඩොලර් 800 ක පමණ වියදම් වන ශල්‍ය කර්මයක් මගින් සිදු කළ හැකි ය. එහිදී ඇස්පිය මත සිහින් කෘත්‍රිම කැපුමක් දැමීමෙන් ඇස් විශාල ලෙස දිස් වේ.

සීත සෘතුවේ නිවාඩු කාලවලදී ශල්‍ය වෛද්‍යවරු කාර්ය බහුල වෙති. බහුතරය පැමිණෙන්නේ ඇස් සම්බන්ධව වුවද නාසය සැකසුම ද බහුතරයක් දරුවන් අතර ජනප්‍රිය ය. වෛද්‍ය ලී මින් කු පවසන්නේ මොවුනට ප්ලාස්ටික් සැත්කම් පිළිබඳ විශේෂ දැනුමක් තිබෙන බව යි. ඔවුන් තම වෛද්‍යවරයාට විද්‍යාත්මක වචන භාවිතා කරමින් භාවිත කළ යුතු ශල්‍ය කර්ම ක්‍රමය පවා කිය යි. ඒ අතර එම වයසට ගැලපෙන පරිදි සඟරාවක ඇති නිළියකගේ පිංතූර පෙන්වා එහි ආකාරයට ඇස් සකස් කර දෙන ලෙස ඉල්ලන පිරිස් ද වෙති.

දකුණු කොරියාව සාම්ප්‍රදායික මට්ටමින් මිදී තරගකාරී මට්ටමකට පිවිස ඇත. බොහෝ දරුවන් ප්ලාස්ටික් සැත්කම් වලට මුහුණ දීම හේතුවෙන් වර්තමාන දෙමව්පියෝ තම දරුවන් පිළිබඳ අධ්‍යාපනික වශයෙන් ඇතිවන පසුබෑම් සම්බන්ධව වන කනගාටුවට සමාන වූ බියක් බාහිර පෙනුම අහිත් පසුබෑමකට ලක් වීම සම්බන්ධයෙන් දක්වයි. දෙමව්පියෝ දරුවන්ට උගන්වනවා හා සමානව ම ප්ලාස්ටික් සැත්කම් කිරීම සඳහා ද යොමු කරවති. බාහිර පෙනුම සාර්ථකත්වයට හේතු වන බව ඔවුහු පිළිගනිති. වර්තමාන කොරියාවේ පවතින තත්ත්වය අනුව දරුවකුට තම පියාගේ වාහනයේ යතුර ලබා ගන්නවාට වඩා ඉතා පහසුවෙන් ඔවුන් ලවා ප්ලාස්ටික් සැත්කමක් කරවා ගත හැකි ය.

වසරක් ගත වීමෙන් පසුවත් එම පැල්ලම් එසේ ම තිබුණ අතර ඇය වෛද්‍යවරයාගෙන් ඒ පිළිබඳ විමසා සිටියා ය. ඔහු පැවසුවේ එම කැලැල් සුව නොවන බවත් ඒ සඳහා තවත් ශල්‍ය කර්මයක් අවශ්‍ය වන බවත් ය. ඇය උසාවි ගියා ය. ඇයට නාන ඇඳුම ඇඳීමටවත් මෝස්තර නිරූපණ කටයුතු කිරීමටවත් යම් යම් ලිංගික දර්ශනවලට පෙනී සිටීමටත් මේ නිසා නොහැකිවූ බව ඇගේ පැමිණිල්ල විය. (දැනට නඩුවක් ඇසෙමින් පවතින නිසා මීට අදාල රෝහල ඒ පිළිබඳව මෙම ලිපියට අදහස් පළ කිරීමට අකමැත්ත පළ කළේ ය.) සුවාත්ප්‍රදීප් පවසන ආකාරයට පලාස්ටික් සැත්කම් ව්‍යසනයේ පෝස්ටර් සඳහා දැන් ඇය පෙනී සිටියි. එවන් පෝස්ටරයක් යල් පැන ගිය නීති පවතින තායිලන්තයේ ඉන්දුනීසියාවේ හා චීනයේ වැනි රටවල මිනිසුන් අවදි කරවීම සඳහා ඉතා වැදගත් වනු ඇත. ආසියාකරයේ ඉතා වේගයෙන් පැතිරෙන භයානක තත්ත්වයක් ලෙස එක්සත් ජනපදයේ දැඩි ලෙස සීමා කර ඇති සිලිකොන් එන්නත ලබාදීම හැඳින්විය හැකි ය. ආසියාකරයේ මෙම එන්නත් නාසය, පියයුරු මෙන් ම ලිංගික අවයව වල ප්‍රමාණය විශාල කිරීම සඳහා යොදගනියි. එහි ක්ෂණික ප්‍රතිඵල ලැබේ. නමුත් ක්‍රමයෙන් ඒවා එල්ලා වැටීම සිදු වන අතර සෛල විඛාදනය වීම ද සිදුවිය හැකි ය. එය රුධිර සංසරණයට එකතු වූ විට නියතව ම මරණය සිදු වේ. වසර දෙකකට පෙර ලිංගික වෙනස්කම් ඇති කිරීම උදෙසා සිලිකොන් ශරීර ගත කළ අයෙක් එහි ප්‍රතිඵලයක් ලෙස මියගොස් ඇත. මෙසේ භාවිතා කරන සිලිකොන් වෛද්‍ය ක්ෂේත්‍රයේ භාවිතා කරන සිලිකොන් නොව, කර්මාන්තයක් සේ භාවිත වන සිලිකොන් වීම විශේෂයකි. ඒවා ඉතා ලාබදායී වන අතර වෛද්‍ය ක්ෂේත්‍රයේ සිලිකොන්වලට වඩා විෂ සහිත ය.

මෙම ගැටලුවේ එක් කොටසක් වන්නේ බටහිරට වඩා ආසියාවේ නීතිමය සීමා කිරීමේ අපහසුවයි. බහුතරයක් ආසායාතික නීතිඥවරු මූල්‍යමය ශක්තිය අවම වීම නිසා මෙමගින් නඩු මගහරිති.

සියල්ලන්ටම වැඩිය මිනිසුන්ගේ කේවල් කිරීමේ ගතිය නිසා සුදුසුකම් රහිත පුද්ගලයින් වෙත යොමුවීම වැඩිවී ඇත. මේ සියල්ල සම්බන්ධයෙන් රජයට ඉක්මන් තීරණයක් ගත යුතුව ඇත. සිංගප්පූරුවේ කැට්ඩන් වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍ය වොෆ්ල්ස් වූ පවසන අන්දමට "මෙය පිපිරීමට ආසන්නව පවතින කාල බෝම්බයකි."

ඇත්ත වශයෙන්ම අත්‍යවශ්‍ය නොවූ ජීවිත හානි සිදුවිය හැකි හෝ විරූපී විය හැකි ශෛල්‍යකර්ම සම්බන්ධයෙන් මෙවන් අවධානමකට මුහුණදීම අන්තරාදයක ය. එහෙත් ලස්සනවීම සඳහා එම අවධානම නොදැරිය යුතු යැයි පවසන කෙනෙක් නැත. පුද්ගලයෙක් සම්බන්ධ වැදගත් වන්නේ "මුහුණ නොව හදවතයි" යනුවෙන් ජපන්

## ආසියාවේ ජනප්‍රිය ම ප්ලාස්ටික් සැත්කම් කරන ක්ෂේත්‍ර මේවා ය.

### විශාල ඇස්

වක් වූ සම් කැබැල්ලක් උඩු ඇසිපිය මත තබා නැම්මක් ඇති වන ආකාරයට මැසීම (ආසියාවේ ඉතා ජනප්‍රිය ය. වියදම $200 $3000

### මුහුණ සිහින් කිරීම

බොටුලිනම් ටොක්සින් ද්‍රාවණය කම්මුල් වලට එන්නත් කර මුහුණේ ඇති මස් පිඩු දුර්වල කිරීමෙන් පසු ඒවා හැකිලීමට භාජන වේ.
කොරියාවේ ජනප්‍රිය ය.[1000 ජපානයේ [2000

### නාසය විශාල කිරීම

හ්‍යූලුරොනික් ඇසිඩ් වැනි දෙයක් එන්නත් කිරීමෙන් හෝ කෘත්‍රිම කාටිලේජ් නාසයේ තැන්පත් කිරීමෙන් හෝ සිදු කරයි.
කොරියාවේ ජනප්‍රිය ය [2500 ජපානය [3700 චීනය [240

### නාසය කුඩා කිරීම

නාසයේ පළල අඩු කිරීම සඳහා නාස්පුඩු කපා හැඩ ගැන්වීම හෝ කාටිලේජ හෝ අස්ථි ඉවත් කිරීම ඉන්දුනීසියාවේ ජනප්‍රිය ය. [ 350 –[1100

### කන්‍යාපටල නැවත සකස් කිරීම

කන්‍යාපටලයේ ඉතිරි කොටස් එකට එක් කර ඇලවීම මගින් කන්‍යාභාවය නැවත ඇතිකරනු ලබයි. චීනයේ ජනප්‍රිය ය [ 360

### පුරුෂ ලිංගය විශාල කිරීම

කොලැජන් හෝ (නීති විරෝධි ලෙස සිලිකොන්) එන්නත් කිරීම මගින් සිදු කරයි ඉන්දුනීසියාවේ ජනප්‍රිය ය [ 550 ජපානයේ [ 2000

### පිරිමි ගැහැනුබවට පරිවර්තනය කිරීම

පුරුෂ ලිංගය ඉවත් කර වෘෂණ කෝෂවලින් ලබා ගන්නා සම යොද ගෙන සිදු කරයි. තායිලන්තයේ ජනප්‍රිය ය. (([ 4000)

### කකුලේ කෙණ්ඩ සිහින් කිරීම

කකුලේ තහර ඉවත් කිරීමෙන් මස් පිඩු අඩපණ කර සිහින් කිරීම
කොරියාවේ ජනප්‍රිය ය [ 2000 ජපානයේ [ 2000

ජාතිකයන් අතර කියමතක් ඇත. මේ පිළිබඳව විමසූවිට හැමදෙනාම පවසන්'තෙ'' සියල්ලන්ට ම වඩා බාහිර පෙනුම වැදගත් වන බව රූපවාහිනී වැඩසටහන්' නිෂ්පාදකයෙක් වන කොජි කෙන්ඩෝ පවසයි. මෙම අදහස පෙරදැරිව beauty colosseum නමින් රූපලාවන්‍ය විශේෂඥයන් පිරිසක් සමග ආරම්භ කළ රූපවාහිනී වැඩසටහන නිසා වයස 20 ගණන්වල හා ඊට පහළ තරුණ කොටස්වලින් 64% ක් පමණ 2001 වැප්රීලු ප්ලාස්ටික් සැත්කම සඳහා අත්සන් තබා සිටියහ. එම වැඩසටහනේදී විවිධ රූපලාවන්‍ය ගැටළුවලට පිළිතුරු සැපයීම කළ අතර ගැටළුකාරී අපහසු අවස්ථා රූපලාවන්‍ය ආශ්චර්යමය වෛද්‍යවරයා ලෙස නම්කරනු ලැබූ ටොෂියා හැන්ඩා වෙත යොමු කෙරිනි. ඔහු ඔටිගුකා අකඩමියේ (ආලේපන හා ප්ලාස්ටික් සැත්කම් ඇකඩමිය.)

## නව ආරම්භයක්



වින්ග් වෙයි, 37 තායිවාන ජාතිකයෙකි 1997 වසරේ දී දැඩි පිළිස්සීම් වලට භාජනය විය. ඩොලර් 60000ක් වැය කොට ප්ලාස්ටික්සැත්කමක් මගින් මුහුණ නැවත සකස් කරන ලදී.

## දුක් නොවන්න සතුටු වන්න



සඹිරි ටොඩා, 17 ජපන් ජාතිකයෙකි. ඇගේ පටු දැස් නිසා නිතර අපහසුතාවට පත්ව සිටි අද ඇගේ දැස් නාසය හා නිකට සකස් කර ගත්තා ය.

මෙම වැඩසටහනේ අමතක කළ නොහැකි අමුත්තා වන්නේ ඔසාකා වලින් පැමිණි 26 වියැති යූමි සතාගුචි ය. ඇය ඉපදුනේ මලානික ඇසකුත් ආකර්ශනීය නොවූ නිකටක් හා ඉදිරියට පැමිණි දතුත් සමග ය. මේ නිසා ඇය පාසැලේ දී අවඥාවට භාජනය වූ අතර ඇවිදීමේදී නිතර බිමට යොමු කර ගත් මුහුණින් යුතුව ගමන් කළ බව පැවසුවා ය.

ඇගේ පියා දියවැඩියා රෝගයෙන් පෙලුණ අතර ඒ සඳහා විශාල වියදමක් දැරීමට ඔවුනට සිදු විය. ඇය අවන්හලක රැකියාවක් සඳහා ගියා ය. එහිදී ද ඇගේ පෙනුම නිසා අවන්හල් හිමියෝ ඇයට රැකියාව දීමට කැමති නොවූහ. ඇයට ඉතිරිව ඇත්තේ ඇගේ සිරුර විකිණීම පමණකැයි ඇයට සිතුණි. එහෙත් ඇගේ බාහිර පෙනුම එයට ද බාධකයක් විය.

මේ අතර Beauty Coiosseum වැඩ සටහනකින් ඇයට නොමිලයේ දත් ඇස් හා නිකට සකස් කර ගැනීමට අවස්ථාවක් ලැබුණි. මෙම ශල්‍ය කර්මය සඳහා ඩොලර් 30 000 පමණ වියදම් කිරීමට සාමාන්‍යයෙන් සිදු වේ. දැන් ඇය ඉහළ වැටුපකට අවන්හලක සේවය කරයි. ඇගේ වර්තමාන පෙම්වතා ඇගේ පැරණි පෙනුම තිබුණේ නම් ඇයට ආදරය නොකරන බව පැවසූ විට සිත රිදවා ගත් ඈ පවසන්නේ මිනිසුන් බාහිර පෙනුම නිසා නොව ඇතුළාන්තය තුළින් වටහා ගත යුතු බව යි. එහෙත් ඇගේ පෞද්ගලික අත්දැකීම් තුළින් ම එය සත්‍යයක් නොවන බව ඇය අවබෝධ කර ගෙන සිටියි. ඇය පවසන පරිදි "ජීවිතයේ වඩා හොඳ දේවල් සෑම විට ම ලැබෙන්නේ ලස්සන ගැහැනු ළමුන්ට ය."

කාන්තාවෝ පමණක් නොව පිරිමි ද ප්ලාස්ටික් සැත්කම් සඳහා යොමු වී සිටිති. තායිවාන් ජාතික විකට ශිල්පයකු වූ ට්සි ටූ එවැන්නෙකි. ඔහුගේ පෙර තිබූ මුහුණ විකට ජවනිකා සඳහා ඔහුට ප්‍රයෝජනවත් වුවද රංගන ජීවිතයේ ඉදිරියට යාම සඳහා එම මුහුණේ ස්වරූපය ඔහුට බාධාවක් වීම ඔහු ප්ලාස්ටික් සැත්කමකට මුහුණ දීමට හේතු විය.

එසේ ම තායිවාන ජාතික වින්ග්වෙයි රූපවාහිනියේ ගින්නක් අතරින් පැන යන දර්ශනයකින් පිළිස්සීමට ලක් විය. මෙයින් කළකිරීමට පත්වූ ඔහු දිවි නසා ගැනීමට පවා උත්සාහ කළේ ය. අවසානයේ ඔහුට පිහිට වූයේ ප්ලාස්ටික් සැත්'කමකි. ඔහුගේ මුහුණේ සම, නැවත සිටවූ කොණ්ඩය හා ප්‍රතිෂ්ඨාපනය කරන ලද දෘෂ්ටි විතානය ආදි සියල්ල ඔහු භාජනය වූ පලාස්ටික් සැත්කමේ ප්‍රතිඵලය වේ.

ප්ලාස්ටික් සැත්කම් නිසා සමහර පුද්ගලයෝ ව්‍යසනයන්ට ගොදුරු වුවත් සමහර පුද්ගලයෝ නැවත උපත ලබති. ප්ලාස්ටික් සැත්කම් පිළිබඳව නිරන්තරයෙන් ලියන හිරෝෂි යමාමොටෝ පවසන්නේ සමස්ත ආසියාව ම තරුණ සංස්කෘතිය විසින් පාලනය කරනු ලබන බව යි. "අපි වැඩිහිටියන්ට ගරු කළ යුතු ය. එහෙත් ප්‍රධාන භූමිකාව රඟපානුයේ තරුණ පරපුර ය. මේ නිසා තවදුරටත් තරුණ නොවන පිරිසට තරුණ වීමට ඇති අවශ්‍යතාවත් තරුණයන්ට වඩා ආකර්ෂණීය වීමට ඇති අවශ්‍යතාවත් පුදුමයට කාරණයක් නොවේ".

මමත්වය නිසා හෝ පුහු ආටෝපය නිසා හෝ මුදල් නිසා හෝ අප සියලු දෙනාට ම වඩා හොඳ තරුණ අලංකාර පෙනුමක් අවශ්‍ය ය. ලස්සන පිළිබඳව විවිධ දෙනා විවිධ මත පළ කරති. ඒ කෙසේ වුවත් බහුතරයක් පිරිස මෙම රටාවට හසු වී හමාර ය.

එහෙත් ඒ ලස්සන වුවද කල් පවතින සදාකාලික ලස්සනක් නොවන බව සිහි තබා ගැනීම වැදගත් ය.

ඔබගේ අවශ්‍යතා ඉටුකිරීම එතරම් පහසු හෝ ලාභදායක නැත. ❑

**චමිලා නිස්සංග**

**2002 අගෝස්තු Time ඇසුරිනි**

# රස කතා

## ගැටලුවක්

එක්තරා මිනිසෙක් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කළේ ය.

"මට සහෝදරයන් හය දෙනෙක් ඉන්නවා," හෙතෙම කීවේ ය.

"අපි ඔක්කෝමලා ඉන්නේ එකම කාමරයක. ඔවුන්ට සුරතල් සතුන් ගොඩක් ඉන්නවා. එක් කෙනෙකුට රිලවා දෙලොස් දෙනයි, තව කෙනෙකුට බල්ලෝ දෙළහයි, කාමරයේ වාතය හොඳටම අපවිත්‍රවෙලා. ඔබතුමාලා මේකට පිළියමක් කරන්ට ඕනේ!"

"කාමරයේ ජනෙල් තියෙනවද?" නිලධාරියා ඇසුවේ ය.

"ඔව්" මිනිසා කීවේ ය.

"ඇයි? ජනෙල් ඇරලා තිදගන්ට බැරි ද?"

"ඔබතුමා නම් කියයි. එතකොට මගේ පරෙවියන් විසිදෙනාත් ඉගිලිලා යාවි !"

## ලිං මැඩියෝ

ස්ත්‍රී මැඩියා - අනේ බලන්ටකෝ, මං අර ඉස්සර ගෙදර වැට ළඟට ගියා. ඒ ගෙදර සැමියා එයාගෙ බිරිඳට,"ඔහේ හරියට ළිදේ ඉන්න ගෙම්බෙක් වගේ, රටේ තොටේ මොකුත්ම දන්නේ නෑ!" කියල බනිනවා ඇහුනා. ඒ ගෑනු හිත්ද තිකන් අහක ඉන්න අපිත් නරක අය වෙනවා !

පුරුෂ මැඩියා - ආ ..... ඕකට ඔයහැටි කේන්ති ගන්ට එපා. අපි ඉන්නේ ඇලේනේ. අපි ළිංවල ජීවත් වෙන්නේ නැනෙ!

**අනුවාදය - පරාක්‍රම ඇස් විජේවර්ධන.**